# සඞ්ඝසතු දනින් මහත්ඵල මහ අනුසස් පසක් කර පෙන්වන දක්ඛිණා විභංග සූත්‍රය

*- ආචාර්ය අලහේනේගම සුමනරතන හිමි -*

මෙලොව උපදින ඕනෑම අයෙකුට ජීවවිද්‍යාත්මක වූ ස්වකීය අවශ්‍යතාවන් සාධාරණ ලෙස ඉටුකර ගැනීම මූලික අයිතියක් සේ සැලකිය හැකිය. එය තමන්ට ඉටු කර ගත නොහැකි නම් ධර්මානුකූලව පුණ්‍ය කටයුත්තක යෙදීමේ අභිප්‍රේරණකය ප්‍රතිඵල මත හෝ අන්‍යයන් විසින් සම්පූර්ණ කිරීම යුක්ති යුක්තය. ඊට අදාළව සප්‍රාණික හෝ අප්‍රාණික වස්තුවක් කිසියම් තැනැත්තෙකු විසින් තවත් අයෙකුට දැහැමෙන් ප්‍රදානය කිරීම "දානය" ලෙස හැඳින්විය හැකිය.

පාලි භාෂාවෙන් "දක්ඛිණා" යන පදයට "දානය" "පරිත්‍යාගය" "පූජාව" යන අර්ථ පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ ගෙනහැර දක්වති.[1] බෞද්ධ ශබ්දකෝෂයෙහි දානය, උතුමන්ට පිරිනමන දන, දක්ෂිණාව යන අර්ථ "දක්ඛිණා" යන්නට දක්වා ඇත.[2] දීම, පරිත්‍යාගය, දියයුතු වස්තුව යන තේරුම් ශ්‍රී සුමංගල සිංහල ශබ්දකෝෂයෙහි "දාන" යන්න විස්තර කිරීමට යොදාගෙන තිබේ.[3]

*"අන්නාදී දාන වත්ථූනං - චාගො සුබුද්ධි පුබ්බකො*

*යො තං දානන්ති දීපෙන්ති - බුද්ධො දානග්ගදායිනො"*

"ආහාර ආදී දාන වස්තු නුවණින් යුතුව පරිත්‍යාග කිරීම දානය යි. අග්‍රදාන දෙන බුදුවරු දෙසත්". යනුවෙන් දානය යනු කුමක්දැයි 'සද්ධම්මෝපායන' ග්‍රන්ථයෙන් ද ප්‍රකාශ වෙයි.[4]

පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් හෝ තමා අයත් දෙයක් කම්පල සලකා දීම හඳුන්වා ඇත්තේ ද දාන නමිනි.[5] ආහාරපාන, වස්ත්‍ර ආදී විවිධාකාර වස්තූන්ට ද "දාන" යන නාමය ව්‍යවහාර කරති.

අභිධර්මයට අනුව තමන්ට අයත් වස්තුවක් අනුන්ට දීම වශයෙන් සිතෙහි හටගන්නා චේතනාව "දානය" නමින් හැඳින්වෙයි.[6]

"යමක් කරණකොට ගෙන දෙනු ලැබේද ඒ ආලෝභ චේතනා තොමෝ දානය නම් වේ" යනුවෙන් නාරද හිමියෝ අරුත දක්වති.[7]

මෙලොවට පමණක් නොව පරලොව සුගතිගාමී වීමටත්, බෞද්ධයාගේ පරම නිෂ්ටාව වූ නිර්වාණ සම්පත්තිය සාධා ගැනීමටත් මූලික වන "දානය" පිළිබඳ ත්‍රිපිටක ධර්මයේ බොහෝ තැන්වල සඳහන් වන අතර එයින් සුවිශේෂී සූත්‍ර ධර්මයක් ලෙසින් මජ්ඣිම නිකායේ අන්තර්ගත දක්ඛිණාවිභංග සූත්‍රය හැඳින්විය හැකිය.

මහා ප්‍රජාපතී ගෝතමිය යනු බුදුරජාණන් වහන්සේ සිද්ධාර්ථ කුමාර කල බොහෝ උපකාර කළ තැනැත්තියයි. ඉපදී දින කිහිපයකින් පසුව තම මව මිය ගිය නිසා කිරිපොවා පෝෂණය කොට රැකබලා ගත් නිසා ඇය බෝසතුනට කිරි මව වූවාය. සුළු මව ද වූවාය. දිනක් තමා විසින්ම සකස් කොට වියා ගන්නා ලද පිළිසගලක් (අලුත්ම වස්ත්‍ර දෙකක්) කිඹුල්වත් නුවර න්‍යග්‍රෝධාරාමයේ වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් "පිළිගන්නා සේක්වා" යි අයැද සිටියාය. දෙවන වරද තෙවන වරද අයැද සිටියත් එම අවස්ථා තුනේදීම බුදුරදුන්ගේ ප්‍රකාශය වූයේ ගෝතමිය වස්ත්‍ර දෙක සංඝයා විෂයෙහි දෙව, "මම ද පූජිත" වෙමි යන්නයි.

මෙම අවස්ථාවේ අපේක්ෂා භංගත්වයට පත් වූ ගෝතමියට උපකාර පිණිස කරුණු ඉදිරිපත් කිරීමට බුද්ධෝපස්ථායක ආනන්ද තෙරණුවෝ ඉදිරිපත් වූහ. වැදූ මව කලුරිය කළ කල කුඩා කාලයේ සිට



බුදුරජාණන් වහන්සේට බොහෝ උපකාර කළ නිසාත් තෙසරණ සරණ ගිය නිසාත්, පඤ්චසීල ප්‍රතිපත්තියෙන් සමන්වාගත නිසාත්, චතුරාර්ය සත්‍ය කෙරෙහි නිසැක වූ නිසාත් ඇයට පිහිට වන ලෙසට ආයාචනා කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකු ලැබීමෙන් තිසරණගත පුද්ගලයෙකු වුවත්, චතුරාර්ය සත්‍යයෙහි නිසැක වුවත් උපකාර වශයෙන් වන්දනා කිරීම, හුනස්නෙන් නැගිට ගෞරව කිරීම, සිව්පසය දීම ආදියෙන් ප්‍රතිඋපකාර කළ නොහැකි බව පෙන්වා දුන්හ.

### පෞද්ගලික දාන 14

අනතුරුව පෞද්ගලිකව යම් යම් අයට දිය හැකි දාන 14 ක් පවතින බව අනඳ තෙරුන්ට දේශනා කළහ. ඒවා මෙසේය.

1. අරහත් තථාගත සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විෂයෙහි දන්දීම
2. පසේ බුදුවරුන් විෂයෙහි දන්දීම
3. අරහත් තථාගත ශ්‍රාවකයන් විෂයෙහි දන්දීම
4. රහත්ඵල ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන් ශ්‍රාවකයන් විෂයෙහි දන්දීම
5. අනාගාමි පුද්ගලයා විෂයෙහි දන්දීම
6. අනාගාමිඵල ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නවුන් විෂයෙහි දන්දීම
7. සකදාගාමි පුද්ගලයාට දන්දීම
8. සකදාගාමිඵල පසක් කිරීමට පිළිපන්නවුන් විෂයෙහි දන්දීම
9. සෝවාන් පුද්ගලයාට දන්දීම
10. සෝවාන්ඵල ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නවුන් විෂයෙහි දන්දීම
11. කාමයෙහි වීතරාගී වූ බාහිර තාපසයන් කෙරෙහි දන්දීම
12. පුහුදුන් සිල්වතුන් කෙරෙහි දන්දීම
13. පුහුදුන් දුශ්ශීලයන් විෂයෙහි (අනුන් පෙළා ජීවත් වන පුද්ගලයන් විෂයෙහි) දන් දීම
14. තිරිසන් ගිය සතුන් කෙරෙහි දන් දීම යනුවෙනි.

### පෞද්ගලික දාන 14 හි ආනිසංශ ප්‍රමාණ

පෞද්ගලික දාන 14 විෂයෙහි පවත්නා ආනිසංශ ප්‍රමාණය ආනන්ද හිමියන්ට මෙසේ ප්‍රකාශ කොට සිටියහ.

1. තිරිසන් ගිය සතුන් කෙරෙහි දන් දීමෙන් ආනිසංශ සියයක් ලැබේ.
2. පෘථග්ජන දුශ්ශීලයන් විෂයෙහි දන් දීමෙන් ආනිසංශ දහසක් ලැබේ.
3. පෘථග්ජන සිල්වතුන් කෙරෙහි දන් දීමෙන් ආනිසංශ සිය දහසක් ලැබේ.
4. කාමයෙන් වීතරාගි වූ බාහිර තාපසයන් කෙරෙහි දන් දීමෙන් කෙළ ලක්ෂයක් ආනිසංශ ලැබේ.

   මෙයින් පසු දැක්වෙන උතුමන්ට දෙන දානානිසංශ පිළිබඳ කවර කථාද?

5. සෝවාන්ඵල ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නවුන් කෙරෙහි දන් දීමෙන් අසංඛ්‍යෙය අප්‍රමේය අනුසස් ලැබෙයි.
6. සෝවාන්වූ පුද්ගලයන්ට දන් දීමෙන් අසංඛ්‍යෙය අප්‍රමේය ආනිසංශ ලැබෙයි.
7. සකදාගාමිඵල පසක් කිරීමට පිළිපන්නවුන් විෂයෙහි දන් දීමෙන් දන් දීමෙන් ද අසංඛ්‍යෙය අප්‍රමාණ ආනිසංශ ලැබෙයි.
8. සකදාගාමි පුද්ගලයන්ට දන් දීමෙන් ද අසංඛ්‍යෙය අප්‍රමේය ආනිසංශ ලැබෙයි.
9. අනාගාමිඵල ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නවුන් කෙරෙහි දන් දීමෙන් අසංඛ්‍යෙය අප්‍රමාණ වූ ආනිසංශ ලැබෙයි.
10. අනාගාමි පුද්ගලයා විෂයෙහි දන් දීමෙන් ද අසංඛ්‍යෙය අප්‍රමාණ වූ ආනිසංශ ලැබෙයි.
11. රහත්ඵල ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන් ශ්‍රාවකයන්ට දන් දීමෙන් ද අසංඛ්‍යෙය අප්‍රමාණ වූ ආනිසංශ ලැබෙයි.
12. අරහත් තථාගත ශ්‍රාවකයන් විෂයෙහි දන්දීමෙන් ද අසංඛ්‍යෙය අප්‍රමේය ආනිසංශ ලැබෙයි.



13. පසේ බුදුවරුන් විෂයෙහි දන් දීමෙන් අසංඛ්‍යෙය අප්‍රමේය ආනිසංශ ලැබෙයි.
14. අරහත් තථාගත සම්‍යක් සම්බුදුවරුන් විෂයෙහි දන් දීමෙන් ද අසංඛ්‍යෙය අප්‍රමාණ වූ ආනිසංශ ලැබෙයි.

### සාංඝික දාන 07

මෙහිදී තථාගතයන් වහන්සේ සංඝගත දක්ෂිණා හතක් පිළිබඳව ද ආනන්ද හිමියන්ට ප්‍රකාශ කළහ.

1. බුද්ධ ප්‍රමුඛ උභතො සංඝයා කෙරෙහි දන්දීම.
2. තථාගතයන් වහන්සේ පිරිනිවි කළ උභතො සංඝයා කෙරෙහි දන්දීම.
3. භික්ෂු සංඝයා කෙරෙහි දන්දීම.
4. භික්ෂුණී සංඝයා කෙරෙහි දන්දීම.
5. මෙතෙක් මට භික්ෂූහු ද භික්ෂුණීහු ද සඟින් උදෙසා ලවයි (ඉල්වාගෙන) දන්දීම.
6. මෙතෙක් මට භික්ෂූහු සඟින් උදෙසා ලවයි (ඉල්වාගෙන) දන්දීම.
7. මෙතෙක් මට භික්ෂුණීහු සඟින් උදෙසා ලවයි (ඉල්වාගෙන) දන්දීම.

උක්ත දාන වර්ග දෙකෙන් මහා ඵලතර වන්නේ සාංඝික දානය ම බව ද බුදුරදුහු අවධාරණය කළහ.

### දක්ෂිණා විශුද්ධි 4

1. දායකයා හේතුකොට ගෙන දානයක් විශුද්ධි බවට පත්වෙයි.
2. ප්‍රතිග්‍රාහකයා හේතුකොට ගෙන දක්ෂිණාවක් විශුද්ධි බවට පත්වෙයි.
3. දායකයා හා ප්‍රතිග්‍රාහකයා යන දෙදෙනාම හේතුකොට ගෙන ද දක්ෂිණාවක් විශුද්ධි නොවෙයි.
4. දායකයාත්, ප්‍රතිග්‍රාහකයාත් හේතුකොට ගෙන දක්ෂිණාවක් විශුද්ධි බවට පත්වෙයි.[8]

02 MAY 2012

මහාප්‍රජාපතී ගෝතමිය මුල් කරගනිමින් දක්ෂිණා විභංග සූත්‍රයෙන් මතුකොට පෙන්වන "දානය" ලෝභයට මරු පහරක් එල්ලකරමින් සසර කතරින් එතෙර වන්නට යත්න දරන සෑම දෙනා විසින් ම අතිශයින්ම අවධානය යොමු කළ යුතු අංගයකි. බුදුරදුන් විසින් විවිධ වූ පුණ්‍ය ක්‍රියාධර්ම අතර ප්‍රමුඛස්ථානය දී තිබෙන්නේ ද එහි ඇති වටිනාකම ලෝවැස්සන්ට පසක් කර දෙනු සඳහාමය. ත්‍රිපිටකයේ බොහෝ තැන්වල දානය පිළිබඳව සඳහන් කෙරෙන කරුණු අතරින් ඒ සෑම ස්ථානයකම දානයට මුල් තැනක් ලබාදුන් ආකාරය පහත සඳහන් උද්ධෘත පාඨ කීපයෙන් වුව ද පෙනේ.

පුද්ගලයෙකුට සම්බෝධි සංඛ්‍යාත වූ පරතෙරට යාමට අතිශයින් උපකාර වන ගුණධර්මයන් ප්‍රකාශ වෙන පාරමී ධර්ම දහයෙන්

"විචිනන්තො තදාද්දක්ඛිං - පඨමං දාන පාරමිං" යනුවෙන් "දානය" පෙරට යොදා ඇත.[9]

ත්‍රිවිධ පුණ්‍යක්‍රියා පිළිබඳ සඳහන් කරන අවස්ථාවේ "තීනි පුඤ්ඤකිරිය වත්ථූනි - දාන, සීල, භාවනා" යනුවෙන් දානය යන්න ප්‍රථමයෙන් යොදා ඇත.[10]

සතර සංග්‍රහ වස්තු කොටස් කර දැක්වීමේ දී චත්තාරි සංගහ වත්ථූනි දානං, පෙය්‍යවජ්ජං, අත්ථචරියා, සමානත්තතා යනුවෙන් දානය උසස් කොට සඳහන් වේ.[11]

ජාතක පාලියේ මහා හංස ජාතකයේ,

"දානං සීලං පරිච්චාංග - අජ්ජවං මද්දවං තපං" වශයෙන් දසරාජ ධර්මයන්ගෙන් මූලස්ථානය හිමිකර ඇත්තේ ද දානයටයි.[12]



දානය වනාහි විවිධාකාර බෙදීම්වලට යටත් වේ. එයින් ප්‍රධාන කොටස් 03 කි. එය,

1. ආමිස දානය
2. අභය දානය
3. ධර්ම දානය වශයෙනි.

පැතුම් සමුදායකින් සම්බන්ධ වූ භෞතික වශයෙන් පරිත්‍යාග කරනු ලබන ප්‍රත්‍යපහසුකම් ආමිස දානය නමින් හැඳින්වෙයි.[13] තවත් ආකාරයකින් කියතහොත් මනුෂ්‍යයන්ගේ සහ අන්‍ය සත්වයන්ගේ සැපයට හේතු වන ආහාරපානාදි වස්තූන් කර්මඵල විශ්වාස කොට දීම ආමිස දාන නම් වේ. හෙවත් සත්වයන්ගේ සැපයට හේතුවන නිරවද්‍ය වූ සකල අවිඤ්ඤාණක සවිඤ්ඤාණක වස්තූන් පරිත්‍යාග කිරීම ආමිස දානය නමින් ප්‍රකාශ වෙයි.[14]

ඉහතින් සඳහන් කරන ලද තුන් වර්ගයෙන් ආමිස දානය සඳහා ආහාරපාන, වස්ත්‍ර, බෙහෙත්, කෙත්වතු, රන්රිදී, මුතුමැණික්, මිලමුදල්, ගේදොර, ඇඳ, මේසපුටු, කොට්ටපැදුරු, කැතිඋදලු, නගුල්, වෑ, පොරෝ, පිහියා, මල් සුවඳ විලවුන් ආදී අප්‍රාණික දේත්, ඇත්, අස්, ගව, මීහිසාදී සප්‍රාණික වස්තූන් ද ඇස්, ඉස්, මස්, ලේ ආදී ශරීර කොටස් ද දාසත්වයට පැමිණීම් වශයෙන් සම්පූර්ණ ආත්මභාවය ද පරිත්‍යාග කිරීම ඇතුළත් වේ.[15]

මහාප්‍රජාපතී ගෝතමිය විසින් භාග්‍යවතුන් වහන්සේට පූජා කිරීම සඳහා ගෙන එනු ලැබූ වස්ත්‍ර දෙක අයත් වන්නේ 'ආමිස' නම් වූ දාන විශේෂයටයි. ගෝතමිය විසින් ම සකසා ගත් වස්ත්‍ර දෙක පූජා කිරීමට පැමිණියේ ලෝකාග්‍ර වූ 'අරහං' වූ බුදුරජාණන් වහන්සේ උදෙසාම ය. එහෙත් සුළු මව විසින් කීපවිටක් ඇවිටිලි කරනු ලැබුවත්, කෘතඥතා පළ කිරීම් වස් ඇ වෙනුවෙන් අග්‍ර උපස්ථායක අනඳ හිමියන් දැඩි ලෙස ආයාචනා කරනු ලැබුවත්, බුදුරදුන් එම ක්‍රියාව හඳුන්වා දෙනු ලැබුවේ පෞද්ගලික වූ පූජා කිරීමක් ලෙසින් මය.

එහෙත් ආනිසංශ පක්ෂය පිළිබඳව සඳහන් කිරීමේ දී පෞද්ගලිකව මිනිස් තිරිසන් ආදී ඕනෑම අයෙකුට දානයක් දීමෙන් උපයා ගන්නා පිනෙහි පල විපාකයන්හි තරම වර්ග කරනු ලැබුවත්, එහි ඇති වටිනාකම උසස් කොට ඇති බැව් පෙනේ. පෞද්ගලික දාන තුදුසෙන් අන්තිමට ම දක්වා ඇත්තේ තිරිසනුන් විෂයෙහි දෙනු ලබන දානයයි. ආනිසංශ කැමැත්තෙන් බලු, ඌරු, කකුළු, කවුඩු ආදී සතුන් අතරින් තමා වෙත පැමිණි සතෙකුට යම් පමණකින් යමක් දෙයි ද, "තිරච්ඡාන ගතෙ දානං දත්වා සත ගුණානි" යනුවෙන් අනුසස් සියයක් ලැබෙන බව ප්‍රකාශ වෙයි.[16]

මෙසේ සඳහන් වෙන ආනිසංශ සියය පිළිබඳව මහාචාර්ය රේරුකානේ චන්ද්‍රවිමල හිමියන් විස්තර කරන්නේ පින් කැමැත්තෙන් යමෙකු බලු කපුටු ආදි සතෙකුට කුස පුරා ආහාරයක් දීමෙන් ජාති සියයක දී ආයුෂය, වර්ණය, සැපයය, බලයය, ප්‍රඥාවයය යන ආනිසංශයන් ලබා ගන්නා බවය.[17]

අටුවාව සඳහන් කරන්නේ ආත්ම සියය බැගින් ආයුෂ සියයක් ද, වර්ණ සියයක් ද, සැප සියයක් ද, බල සියයක් ද, නුවණ සියයක් දැයි පන්සියයක් ආනිසංශ ලබෙන බවය.[18]

තිරිසන් සත්වයාට පසුව වැදගත් වන්නේ පෘථග්ජන දුශ්ශිල මිනිසා ය. ඔහු තිරිසනාට වඩා වෙනස්ය. තිරිසනාට වඩා උසස්ය. එහෙත් සීලවන්තයන්ට වඩා හැසිරීම් හා ගුණධර්ම රටාවෙන් පහත්ය. සිල්වත් කමෙන් පහත් වූ එවන් පුද්ගලයෙකු කෙරෙහි පැහැදීමෙන් යමෙක් යමක් පරිත්‍යාග කරයි ද එම පුද්ගලයාට ආනිසංශ දහසක් ලැබෙයි.[19]

අන්‍යයන්ට පීඩා පමුණුවන අදහැමින් දිවි රකින පුද්ගලයන්ට වෙනස් වූ කෛරාටික කමින් තොර වූ මායාවෙන් විමුක්ත වූ අනුන් නොපෙළෙන්නා වූ, දැහැමෙන් සෙමෙන් සීසෑමෙන් හෝ වෙළඳාමෙන්



හෝ ජීවිතය කරගෙන යන පුද්ගලයා පෘථග්ජන සීලවන්තයෙකි. ඔහුට දන් දීමෙන් ආනිසංශ සිය දහසක් හෙවත් ලක්ෂයක් සැප විපාක ලැබේ.

කාමයෙහි විරාගික වූ බාහිර තාපසයන් යනු කර්මවාදී කිරියවාදීන් හා ලෞකික පඤ්චාභිඥා ලැබූ පුද්ගලයන්ය.[20] රේරුකානේ හිමියන් ඔවුන්ව හඳුන්වා ඇත්තේ සර්වඥ ශාසනයෙන් බැහැර කර්මවාදී ධ්‍යානලාභීන් ලෙසිනි.[21] එවන් පුද්ගලයන්ට දන් දෙන පුද්ගලයා කෙළලක්ෂයක් ආනිසංශ ලබයි. බෞද්ධයාගේ අත්පොතෙහි ජාති කෝටි ලක්ෂයක් ආයුෂාදි සම්පත් ලැබෙන බව සඳහන් වේ.[22]

සෝවාන් ඵලය සිදුකිරීම පිණිස පිළිපන් තැනැත්තාගේ සිට අනන්ත ගුණයෙන් යුක්ත අරහත් තථාගත සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ දක්වා වූ දසවැදෑරුම් වූ උතුමන් කෙරෙහි දන් දීමෙන් අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය වූ ආනිසංශ රාශියක් ඵලවිපාක වශයෙන් අපේක්ෂා කෙරේ. මෙහි අසංඛෙය්‍ය, අප්‍රමෙය්‍ය ආනිසංශ යනු සංඛ්‍යාවක් වශයෙන් හෝ ප්‍රමාණයන් වශයෙන් හෝ නම් කළ නොහැකි බැව් ප්‍රකාශ වේ.

අටුවාචාරීන් වහන්සේ අසංඛෙය්‍ය හා අප්‍රමෙය්‍ය යන්න හඳුන්වා ඇත්තේ මෙපරිදිය.

"............ ජලයාගේ මෙන් සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපදින්නා කෙරෙහි දෙන ලද දානයාගේ අසංඛෙය්‍ය බව දත යුත්තීය. පොළොවේ බල මාත්‍රයක් ප්‍රදේශයෙහි පස් ආදී කොට පෘථිවියගේ යම් පමණ පස් ද එතෙක් අප්‍රමෙය්‍ය බව ප්‍රකාශ කොට දැක්විය යුතුය."[23]

උක්ත පෞද්ගලික දාන තුදුසෙහි ආනිසංශ විමර්ශනයේ දී කිසියම් ආකාරයකට සංඛ්‍යාත්මක වශයෙන් තිරිසන් ගිය සතුන්, පෘථග්ජන දුශ්ශිලයන්, පෘථග්ජන සිල්වතුන්, කාමයෙහි විතරාගී වූ බාහිර තාපසයන් යන සතර වර්ගය කෙරෙහි දෙන දන්ඵල ආනිසංශ සීමාකොට ඇත. ඊට හේතු වශයෙන් බලපා ඇත්තේ ඔවුනොවුන් තුළ පවත්නා ගුණ ධර්මයන්ගේ අඩුවැඩි ස්වභාවයයි. එහෙත් පෞද්ගලික වූවත්

සෝවාන්ඵලය පිණිස පිළිපදින්නාහුගේ සිට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දක්වා වූ උතුමන් කෙරෙහි කර්මඵල අදහමින් වෙ වෙනම දන් පිළිගැන්වීමෙන් සීමාවකින් තොර අප්‍රමාණ වූ අනුසස් ගෙන දීම විශේෂයෙන් අවධාරණය යොමු කළ යුතු කරුණකි.

බුදුරජාණන් වහන්සේ යනු ලොව සියලු දෙනාට වඩා ගුණධර්මයන්ගෙන් පරිපූර්ණ වූ උත්තරීතර, ශ්‍රේෂ්ඨ වූ පුද්ගලයෙකි. ආත්මවාර රාශියකම විවිධ ජාතීන් හී ඉපිද නොයෙක් දුක් ව්‍යසනයන්ට පාත්‍ර වී අප්‍රතිහත ධෛර්යයෙන් දසපාරමිතාවන් සම්පූර්ණ කළ උතුමෙකි. පූජාවන් ලැබීමට ඉතාම සුදුසු වූ උන්වහන්සේ වෙත කුඩා වුවද දානයක් පිළිගැන්වීමෙන් ලැබෙන ඵල විපාක ද සුළුපටු නොවේ. අසංඛෙය්‍යය. අප්‍රමාණය. එසේ වුවත් විශේෂයෙන් උන්වහන්සේ වෙත වුවද කෙනෙකු විසින් සැදී පැහැදී කම්පල අදහා පෞද්ගලිකව චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය, භෛසජ්‍ය, පරිෂ්කාර ආදිය පිරිනැමීමෙන් ලබන ආනිසංශ සංඝගත දක්ෂිණාවක් තරම් අගනා නොවන බව භාග්‍යවතුන් වහන්සේ අනඳ හිමියන්ට අවධාරණය කළහ.

ඊළඟට බුදුරජාණන් වහන්සේ විසින් පෞද්ගලික දාන තුදුසට වඩා සප්තවිධ වූ සාංඝිකව පිරිනමන දානයෙහි ඇති අගය දේශනා කළ ආකාරය විමසිල්ලට ලක් කළ යුතුය. සංඝයා විෂයෙහි දෙනු ලබන දානයෙහි ඇති උසස් බව ආනාපානසති සූත්‍රයෙහි ද බුදුහු භික්ෂූන් වහන්සේලාට මෙසේ සඳහන් කළහ.

"........අපලාපායං භික්ඛවෙ පරිසා නිප්පලාපායං භික්ඛවෙ පරිසා සුද්ධා සාරෙ පතිට්ඨිතා. තථා රූපො අයං භික්ඛවෙ, භික්ඛු සංඝො. තථා රූපායං භික්ඛවෙ, පරිසා, යථා රූපා පරිසා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස. යථා රූපො අයං භික්ඛවෙ, භික්ඛු සංඝො, තථා රූපායං භික්ඛවෙ පරිසා. යථා රූපාය පරිසාය අප්පං දින්නං බහුං හොති. බහු දින්නං බහුතරං. තථා රූපො අයං භික්ඛවෙ භික්ඛු සංඝො......."



"මහණෙනි, මේ භික්ෂු පර්ෂත් නොසිස්යැ, නිෂ්ප්‍රලාපයැ, ශුද්ධ යැ. අධිගමසාරයෙහි පිහිටියැ. සම්බුදු පිරිසෙක් ආහුනෙය්‍ය වේ. ද, පාහුනෙය්‍ය වේ ද, මහණෙනි, මේ භික්ෂු සංඝ තෙමේ එබඳුයැ. මහණෙනි, මේ පිරිස එබඳුයැ, යම්බඳු පිරිසක් කෙරෙහි දුන් ඇලුප් දනෙක් බොහෝ වේ ද, දුන් බොහෝ දනෙක් ඉ බොහෝ වේ ද, මහණෙනි, මේ භික්ෂු සංඝ එබඳුයැ"[24]

මෙයින් පැහැදිලි වන්නේ භික්ෂු සංඝයා කෙරෙහි කුඩා වුව ද දානයක් පිරිනැමීම වටිනා ආනිසංශ ගෙන දීමට හේතු කාරක වන බවය.

සාංඝික දානයෙහි ඇති ආනිසංශයන් හි බලවත්කම පිළිබඳව ඛුද්දක නිකායේ විමානවත්ථු පාලියෙහි පෞද්ගලික දානානිසංශ සමග සසඳා ඇති ආකාරය ද විමර්ශනයට ලක් කිරීම වටනේය.

පෙර කලක එක්තරා ස්වාමියෙකුට භද්‍රාය, සුභද්‍රය යන නම් වලින් භාර්යාවෝ දෙදෙනෙක් වූහ. භද්‍රා සුභද්‍රාවගේ වැඩිමහළු සොහොයුරියයි. භද්‍රා නම් තැනැත්තිය තමන් විසින් මනා ලෙස සකස් කොට සන්සුන් ඉඳුරන් ඇති, බ්‍රහ්මචාරි භික්ෂූන් වහන්සේලාට වෙන් වෙන් ව පෞද්ගලිකව ආහාරපාන පිළිගන්වා එම පින් බලයෙන් තව්තිසා දෙව්ලොව උපන්නීය. තම සොයුරියගේ මඟපෙන්වීම යටතේ දන් දීමට පෙළඹුණු සුභද්‍රාව දිනක් උතුම් ගුණයෙන් යුක්ත වූ රේවත නම් භික්ෂූන් වහන්සේ නමක් හමුවිය. ඇයට අනුකම්පා වූ උන්වහන්සේ දන් පූජා කිරීමට කැමැත්තෙන් පසුවූ සුභද්‍රාවට සාංඝිකව පූජා කිරීමට මග පෙන්වූහ. ඒ අනුව අපමණ සඟගුණ යුතු රේවත හිමියන් ඇතුළුකොට ඇති භික්ෂූන් වහන්සේලා අටනමකට ප්‍රසාද සිතින් දන් පිළිගැන්වීමේ ප්‍රතිඵල වශයෙන් ඇය පසු කලෙක නිර්මාණරතී නම් දිව්‍ය ලෝකයෙහි උපන්නාය. දිනක් තමන් මෙපමණ සැප සම්පත් ලද්දේ කුමන පිනක් නිසා දෝ හෝයි බලන කල සංඝිකව මහසඟනට දන් පිළිගැන්වීමේ පුණ්‍යබල මහිමයෙන්

බව පෙනුණි. අනතුරුව තම සොහායුරිය වූ හද්‍රා කිනම් ස්ථානයක උපත ලදදැයි සෙවීමේ දී ඈ තමාට වඩා ආනිසංශ අඩුවෙන් තව්තිසා නම් දෙව්ලොව ඉපදී ඇති බව දැනගෙන එහි ගොස් හද්‍රා දෙවඟනට ආමන්ත්‍රණය කළාය. එවිට හද්‍රා දෙවඟන මෙසේ ප්‍රකාශ කළාය.

*"දද්දල්ලමනා වණ්ණෙන - යසසාව යසස්සිනී*
*සබ්බේ දෙවෙ තාවතිංසෙ - වණ්ණෙන අතිරොචසී"*

*"දස්සනං නාභි ජානාමි - ඉදං පඨම දස්සනං*
*කස්මා කායානු ආගම්ම - නාමෙන භාසසෙ මමන්ති"*

"යසස් ඇති දෙව්දුව, රූප සම්පත්තියෙන් ද පරිවාර සම්පත්තියෙන් ද අතිශයින් බබළන තෝ තව්තිසා වැසි සියලු දෙවියන් ඒ වර්ණා දී සම්පත්තියෙන් අභිභවා බබළන්නෙහි"

"මම මින් පෙර තී දුටු බවක් නොදනිමි. මෙය පළමු දැකීමයි. කිනම් දිව්‍ය නිකායකින් චුතව අවුත් නමින් මා අමතන්නෙහි ද?[25]

ඊට ප්‍රතිචාර දැක්වූ සුභද්‍රා දෙවඟන මනුෂ්‍ය ලෝකයේ ඔවුන් දෙදෙනාම සහෝදරයින් වශයෙන් ජීවත් වූ කාලය තුළ සිදුවූ සියලු තොරතුරු අනාවරණය කළ අතර දැන් නිර්මාණරතී නම් දෙව්ලොව වසන බවද පෙන්වා දුන්නීය.

එවිට හද්‍රාවන් කවර නම් පිනක් කොට උසස් වූ නිර්මාණරතී දොව්ලොව උපන්නීදැයි විචාළ කල්හි සුභද්‍රාවන් ප්‍රකාශ කරනු ලැබුවේ මෙපරිද්දෙන්ය.

*"සොමෙ අත්ථ පුරෙක්ඛාරො - අනුකම්පාය රෙවතො*
*සංඝෙ දෙහිති මං අවොච - තස්සාහං වචන කරිං"*

*"සා දක්ඛිණ සංඝගතා - අප්පමෙය්‍ය පතිට්ඨිතා*
*පුග්ගලෙසු තයා දින්නං - නතං තව මහප්ඵලන්ති"*



"ඒ රේවත තෙරණුවෝ මා හිතයෙහි පෙරටු වූවෝ අනුකම්පා පිණිස සඟනට දෙවයි මට වදාළහ. මම උන්වහන්සේගේ වචනය කළෙමි"

"ඒ සංඝගත දක්ෂිණා තොමෝ අපමණ ගුණ ඇති සඟන කෙරෙහි පිහිටියාය. තී විසින් පුද්ගලයන් කෙරෙහි දෙන ලද ඒ දානය තිට මහත්ඵල නොවී"

*"අට්ඨෙව පිණ්ඩපාතානි - යං දානං අදදිං පුරෙ*
*දක්ඛිණෙය්‍යස්ස සංඝස්ස - පසන්නා සෙහි පාණිහි"*

"හද්‍රාවනි, යම් හෙයකින් පෙර අත්වැච්හි පහන් සිතැත්තී සියතින් දක්ෂිණාර්හ සංඝයාට පිඬු පා අටත් දාන වශයෙන් දිනිමිද

*"තෙන මෙ තාදිසොවණ්ණො - තෙන මෙ ඉධ මිජ්ඣති*
*උප්පජ්ජන්ති ච මෙ භොගා - යෙ කෙචි මනසො පියා"*

එම පිනෙන් මාගේ සිරුර පැහැය එබඳු වෙයි. එම පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධි වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තීහු වෙත් ද ඒ සම්පතීහු මට පහළ වෙත්"[26]

සංඝික දානයෙහි ඇති වටිනා ඵල විපාක සාක්ෂි සහිතව සුභද්‍රා නම් දෙවඟනගේ අත්දැකීම් තුළින් ම ප්‍රකාශ විමෙන් ද එහි ස්වරූපය කෙබඳුදැයි වටහා ගත හැකිය.

මෙම කථා ප්‍රවෘත්තිය ප්‍රත්‍යක්ෂව ම දැනගත් හද්‍රා නම් දෙවඟන සුභද්‍රා දෙවඟනගේ යසඉසුරු ආශ්චර්ය දැක අතිශයින්ම පසුතැවිල්ලට පත් වූවාය. පෞද්ගලික දානයට වඩා සාංඝික දානයෙහි ඇති අනුසස් දුටු ඇය තව්තිසා දෙව්ලොව සිට මිනිස් ලොවට ගොස් සංඝගත දක්ෂිණා සිදු කිරීමට අධිෂ්ඨාන කර ගත්තේ ද එහි ඇති ඵල විපාකයන්හි තරම මැනවින් අවධානයට යොමු වූ හෙයිනි.

සංඝගත දක්ෂිණාවෙහි ශ්‍රේෂ්ඨ බව දැනගත් ඇය සුභද්‍රා ඉදිරියේ තම අදහස් ප්‍රකාශ කොට ඇත්තේ මෙපරිද්දෙන්ය.

*"ඉදනෙවාහං ජානාමි - සංඝෙ දින්නං මහප්ඵලං*
*සාහං ගන්ත්වා මනුස්සත්තං - වදඤ්ඤු වීත මච්ජරා*
*සංඝෙ දානානි දස්සාමි - අප්පමත්තා පුනප්පුනත්ති"*

"සඟුන් කෙරෙහි දුන් දානය මහත්ඵලය යි මම දැන් දනිමි. ඒ මම මිනිසත් බවට ගොස් (ප්‍රතිග්‍රාහකයන්ගේ) වදන් දන්නී පහ වූ මසුරු මල ඇත්තී අප්‍රමත්තව පුන පුනා සඟනට දන් දෙක්නෙමි"[27]

ත්‍රිපිටකයේ පවත්නා දානයට සම්බන්ධ වූ මෙවන් කථා ප්‍රවෘත්තින් තුළින් ද අතිශයින් ම පෞද්ගලික දානයට වඩා "සංඝෙ දින්නං මහප්ඵලං" යන්නෙහි ශ්‍රේෂ්ඨ බව මතු කරන්නේ නොවේ ද?

ඉහතින් සඳහන් කරන ලද සප්තවිධ වූ සංඝික දානයන්හි ශ්‍රේෂ්ඨ බව දැක්වීමේ දී පෞද්ගලික දානයන්හි පවත්නා ආනිසංශයන්හි ඵල විපාකයන්හි ස්වරූපය වෙනස් වෙනස් ආකාරයෙන් දැක්වුව ද සප්තවිධ සංඝික දානානිසංශ ඒකවිධ වූ අග්‍රතම ස්වරූපයක් ගන්නා බව පෙන්නුම් කිරීම සුවිශේෂී වූ ලක්ෂණයකි.

ලෝකයේ මහා කරුණා නිදාන වූ භාග්‍යවතුන් වහන්සේ හා සමාන කෙනෙක් නම් දක්ෂිණාර්හ නොවෙති. එය කෙසේ වූවත් මෙම සූත්‍රයේ අවසාන භාගයේ ද අනඳ තෙරුන්ට බුදුරදුන් සංඝගත දක්ෂිණාවේ මහන්තත්වය දේශනා කරන්නේ මේ ආකාරයෙනි.

"ආනන්දය, අනාගත කාලයෙහි ගොත්‍රභූ වූ, දුශ්ශීල වූ පාපස්වභාව ඇති කාෂායකණ්ඨ කෙනෙක් වෙති. ඒ දුශ්ශීලයන් කෙරෙහි සඟුන් උදෙසා දන් දෙති. ආනන්දය, මම එකල්හිත් සංඝගත දක්ෂිණාව අසංඛෙය, අප්‍රමේය අනුසස් ඇතියි කියමි. ආනන්දය, මම කවර අයුරකින් වුව ද සංඝගත දක්ෂිණායෙන් පෞද්ගලික දානය මහාඵලතරය යි නොකියමි."[28]



දක්ෂිණා විභංග සූත්‍රයෙහි අන්තර්ගත සංඝික දානය කෙරෙහි බුදුරජාණන් වහන්සේගේ දෘෂ්ටිය පිළිබඳ වූ අටුවාචාරීන් වහන්සේගේ ආකල්ප පාඨක - ශ්‍රාවක ජනයා කෙරෙහි අවධානයට යොමු කරන්නේ මේ ආකාරයෙනි.

"................ බුදුන්ට වඩා ශ්‍රේෂ්ඨ වූ දක්ෂිණාර්හ කෙනෙක් නම් නැත. මෙසේ ඇයගේ චේතනා සය එක්ව බොහෝ කලක් හිත සැප පිණිස පවතිත්, කුමක් සඳහා තුන්වර දක්වා බැහැර මෙසේද සිතක් විය. මම කලක් නො සිටිමි. මගේ ශාසනය සංඝයා කෙරෙහි පිහිටන්නේය. පශ්චිම ජනයා සංඝයා කෙරෙහි ගෞරව උපදවායයි තුන් යලක් ප්‍රතිභාහනය කොට දෙව වූයේ ය. මෙසේ ඇති කල්හි සර්වඥයන් වහන්සේ තමාට දෙන ලද දෙය සංඝයාට දෙව වූයේය. සංඝතෙම දක්ෂණාර්හ යයි පශ්චිම ජනයා සංඝයා කෙරෙහි ගෞරව උපදවා සිව්පසයෙන් ක්ලාන්ත නොවී බණ ඉගෙන මහණකම් කරන්නේය. මෙසේ මාගේ ශාසනය අවුරුදු පන්දාහක් සිටින්නේය යි "පතිගණ්හාතුභන්තෙ භගවාති, යන වචනයෙන් ද මෙය දත යුතුයි"[29]

බෞද්ධයාගේ පරම නිෂ්ටාව වූ නිවන් සම්පත්තිය සාධා ගැනීමේ දී දන්දීම තුළින් තෘෂ්ණාව ක්ෂය කර ගත යුතු බව මූලිකම වූ සිද්ධාන්ත ධර්මයකි. දානය ප්‍රදානය කිරීමේ දී පෞද්ගලික හා සංඝික වශයෙන් ප්‍රතිග්‍රාහක පක්ෂය ද්විප්‍රකාර කොට දැක්වෙයි. පෞද්ගලික දක්ෂිණාවකින් වුවද, දානය ප්‍රදානය කරන්නාට එයින් නිවන් මඟ පසක් කර ගැනීමට මාර්ගය උදාවෙයි. එහෙත් ඉන් මෙපිට ආත්මවල දී සැප විපාක ආනිසංශ ලබා ගැනීමේ වාර ගණන සංඝගත දක්ෂිණාව තුළින් අසංඛෙය්‍ය බවත්, අප්‍රමාණ බවත්, ශ්‍රේෂ්ඨ බවත්, අගනා බවත්, දක්ෂිණාවිභංග සූත්‍රය තුළින් පෙන්වා දී ඇති බැව් අවධාරණය කළ යුතුය.

02 MAY 2012

## පාදක සටහන්

[1] බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, "පාලි - සිංහල ආකාරාදිය", බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 1998, 231 පිටුව

[2] සිරි ලියනගේ, "බෞද්ධ ශබ්දකෝෂය", I භාගය, ඉඳුරු ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, කොට්ටාව, 2007, 648 පිටුව

[3] සෝරත හිමි, වැලිවිටියේ, 'ශ්‍රී සුමංගල ශබ්දකෝෂය' ප්‍රථම භාගය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1999, 442 පිටුව.

[4] "සද්ධම්මෝපායන" සංස්. මීගොඩ කල්‍යාණතිස්ස හිමි, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැලණිය, 1997, 70-71 පිටු

[5] චන්ද්‍රවිමල හිමි; රේරුකානේ, "පාරමිතා ප්‍රකරණය" ෂෂ්ඨ මුද්‍රණය, තිලක් ප්‍රින්ටර්ස්, පන්නිපිටිය, 1989, 95 පිටුව

[6] චන්ද්‍රවිමල හිමි, රේරුකානේ, "අභිධර්ම මාර්ගය", 5 මුද්‍රණය, සීමාසහිත ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ, බොරගැස්ගමුව, 1993, 51-53 පිටු

[7] නාරද හිමි, "පාරමිතා හෙවත් දසපෙරුම්දම්" තෙවන මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 1997, 21 පිටුව

[8] මජ්ඣිම නිකාය, තෘතීයභාගය, බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, ශ්‍රී ලංකා ජනරජය, 1974, දක්ඛිණා විභංග සූත්‍රය, 520-526 පිටු.

[9] "බුද්ධවංසපාලි හා චරියාපිටක පාලි" බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 1977, සුමේධකථා 40-41 පිටු

[10] "දීඝනිකාය - 3", බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ, පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 2004, 366 - 367 පිටු



[11] "දීඝනිකාය - 3", බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ, පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 2004, 390 - 391 පිටු

[12] "ජාතකපාලි - 2 පොත", බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ, පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 2005, 352 - 353 පිටු

[13] "දානය සහ දානශාලා පුරාණය", සංස්කාරකවරු වාචිවේ ධම්මරක්ඛිත හිමි, කරපුටුගල රේවත හිමි, සෙනරත් ගොලුකන්ද, හොය ජ්‍යොං- ශ්‍රී කල්‍යාණි ගංගාරාම ග්‍රන්ථ මාලා - 03, සමන් ප්‍රකාශකයෝ, ගංගොඩවිල, නුගේගොඩ, 2003, 46 පිටුව

[14] "පාරමිතා ප්‍රකරණය" 114 පිටුව

[15] "පාරමිතා ප්‍රකරණය" 14 පිටුව

[16] "මජ්ඣිමනිකාය අටුවාව 4" ඒ.පී. ද සොයිසා පරිවර්තනය, ධර්මසමය යන්ත්‍රාලය, මරදාන, කොළඹ. 1962, 269 පිටුව

[17] චන්ද්‍රවිමල හිමි, රේරුකානේ, "බෞද්ධයාගේ අත්පොත", නවවෙනි මුද්‍රණය, ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ, බොරගැස්ගමුව, 1993, 135 පිටුව

[18] "මජ්ඣිමනිකාය අටුවාව 4" 269 පිටුව

[19] "බෞද්ධයාගේ අත්පොත" 135 පිටුව

[20] "මජ්ඣිමනිකාය අටුවාව 4" 269 පිටුව

[21] "බෞද්ධයාගේ අත්පොත" 134 පිටුව

[22] "බෞද්ධයාගේ අත්පොත" 135 පිටුව

[23] "මජ්ඣිමනිකාය අටුවාව 4" 270 පිටුව

02 MAY 2012

[24] **"මජ්ඣිමනිකාය 3"** පොත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය, ශ්‍රී ලංකා ජනරජය, 1974, 226-227 පිටු

[25] **"විමානවත්ථුපාළි"** බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, 1982, 620-621 ගාථා, 76-77 පිටු

[26] **එම**, 627, 628, 633-634 ගාථා, 78-79 පිටු

[27] **එම**, 627, 628, 633-634 ගාථා, 78-79 පිටු

[28] **මජ්ඣිමනිකාය,** තෘතිය භාගය, 525 පිටුව

[29] **මජ්ඣිමනිකාය** අටුවාව 4, 266 පිටුව